13 වන පිටුවෙන් (අදිසි)

නිදාගෙන... අවේලාවෙ ආවෙ මොනාටද කියලා මං හීං සැරේ ඉස්සිලා බැලුවා.. ආවා.. බෝම්බෙ ගැහුවා.. වෙඩි තිබ්බා.. ආව වේගෙන්ම ආපහු ගියා.. " සෙදෝරිස් ගේ කටහඬ තවමත් වෙවුළයි.

"කාව වත් අඳුන ගත්ත ද..?"

"බණ කතා කරනවා.. කොහෙ අඳුනගන්නද ළමයො.." සෙදෝරිස් ආපසු මිදුලට බසියි.

පොඩි හාමුදුරුවෝ සුනන්දට ළං වෙති.

"දවල් ටෙලිෆෝන් කෝල් එකක් ආවා.. තර්ජනයක්.. ඡන්ද වැඩ වලින් අයින් වෙන්න කියලා ලොකු හාමුදුරුවන්ට තර්ජනය කළා..."

මහ ගේට්ටුව දෙසින් වාහනයක විදුලි ආලෝකය වැටෙයි. දාහතේ වත්තේ එකා දෙන්නා බැගින් පන්සල් වත්තට ඇතුල් වනු ඒ ආලෝකයෙන් පෙනෙයි.

"පොලිස් ජීප්පෙක.." සෙදෝරිස් කියයි.

000000000

සුනන්දගේ මෝටර් සයිකලය මන්ත්‍රී බංගලාවේ ගේට්ටුව ඉදිරියේ නතර කරන විට වේලාව උදෑසන අට පමණ වන්නට ඇත. මුර කුටියෙන් ඔලුව දමා බලන පොලිස් භටයා සුපුරුදු පරිදි ගේට්ටුව අරින්නට එයි.

"ඉන්නවද..?" සුනන්ද අසයි.

"ඉන්නවා.." පොලිස්භටයා ගේට්ටුව අඩක් විවෘත කර සුනන්දට ඇතුළ් වන්නට ඉඩ දෙන අතර පිලිතුරු දෙයි.

රණසිංහගේ ප්‍රාඩෝව පිටුපසින් සුනන්ද මෝටර් සයිකලය නවත්තයි. පඩිපෙළ නැග බංගලාවට ගොඩ වන සුනන්ද දොර අසළ මොහොතක් නැවතෙයි.

"මට මෝටර් සයිකලේ සද්දෙ ඇහුණා.. එන්න සුනන්දයියා ඇතුළට.." වින්ධ්‍යා ගේ ප්‍රබෝධමත් කටහඬ සාලය දෙසින් ඇසෙයි.

සුනන්ද සාලයට ඇතුළ් වී තමාගේ සුපුරුදු අසුනේ වාඩි වෙයි. නිදිවැරීමෙන් රතුව ගිය දෙනෙතින් ඔහු වින්ධ්‍යා දෙස බලයි. ඔහුගේ මුහුණේ රැඳී ඇති බැරෑරුම් පෙණුම ඇගේ සිත මොහොතකට සසළ කරයි. ඈ ඔහු දෙස වික්ෂිප්තව බලා සිටින්නේ එනිසා ය.

"ඇයි..? ප්‍රශ්නයක් ද..?" ඕ අසන්නේ පහත් හඬින් ය. ඔහු සිනාසෙන්නට උත්සාහ කරයි.

"මහත්තයා හම්බවෙන්න ඕනෙ.. " ඔහු කියයි.

"ඊයෙ රෑ තිස්සෙ නිදි මරලා කීයට නිදාගත්තද මන්දා.. ඉන්න.. මං ගිහින් කියන්නං.." වින්ධ්‍යා ගෙතුළට යයි. සුනන්ද සේවිකාව ගෙනැවිත් දෙන තේ කෝප්පය තොල ගාමින් කල්පනාවට වැටෙයි.

"සුනන්ද.." රණසිංහ නිදිගැට කඩමින් සාලයට එයි. ".. උදේම ආව එක හොඳයි.. අපි දෙන්නට ගමනක් යන්න තියෙනව.. මං ඉක්මණට එන්නං.." ඔහු වින්ධ්‍යා දෙස එක්වරක් බලා නැවත ගෙතුළට යයි.

"උදේට කාලා නැහැ නේද සුනන්දයියා.. අපි මොනාහරි කමු.." වින්ධ්‍යා කියන්නේ සුනන්ද පමණක් ඇසෙන සේය.

"බෑ. දැන් කන්න බෑ.. මට බඩගිණි නෑ.." ඔහු ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂෙප කරන්නෙ කැමැත්තෙන් නොවේ. නොකියූ යම් කිසි කරුණක් ඔහු සිත තුළ රැඳී ඇති බව ඇයට දැනෙයි.

"කියන්න.. මොකද්ද ප්‍රශ්නෙ..?" වින්ධ්‍යා අසන්නේ අසළක කිසිවකු නැති බව පසක් කරගත් පසුව ය. ඇගේ බැගෑපත් හඬ ඔහු සිතේ ඇති කරන්නේ අනුකම්පාවකි.

"ඊයෙ රෑ පන්සලට බෝම්බ ගහල .." සුනන්ද පහත් හඬින් කියයි.

වින්ධ්‍යා ගේ මුහුණේ ඇඳෙන්නේ ඔහුට තේරුම් ගත නොහැකි හැඟීමකි.

"ඇයි..?" ඔහු අසයි.

"ඊයේ රෑ මොනා හරි වෙන්න ඇති කියලා මගේ හිත කිව්වා.. මට දැනුණා මොකක් හරි දෙයක් වෙනවයි කියල.."

ඔහු නිහඬ වෙයි. ඇය සමගින් මේ කතාව දිගට ගෙන යන්නට ඔහුගේ සිත ඉඩ නොදෙයි. ඇගේ ඇස් කෙළවර කඳුළක් එක්ව තිබෙණු ඔහු දකියි.

"මේක අපායක්.. මං උදේ හවා මාළිගාවට වැන්ද කෙනෙක්.. ඇයි මට මෙහෙ තැනකට එන්න වුණේ..?" වින්ධ්‍යා මුමුණයි. මේ කතා කරන්නට සුදුසු තැනක් හෝ සුදුසු වේලාවක් නොවේ. "යන්න ඇතුළට... පස්සෙ කතා කරමු.." ඔහු කියන්නේ එනිසා ය.

00000

"අජිත් රස්සාවට ගත්ත එක ගැන සුනන්ද මා එක්ක හිත හොඳින් නෙවෙයි නේද ඉන්නෙ..?" රණසිංහ පෙණ දමන බීර වීදුරුව දෙස බලා සිටියි. හිස ඔසවා සුනන්ද දෙස බලා ඔහු අපහසුවට පත් කරන්නට රණසිංහ නොසිතයි.

මුහුදේ ඝෝෂාව තදින් ඇසෙයි. මනාව වැඩුණ තුරු ගොමුව මුවාවේ ඇති මේ මේසයට මුහුද හරි හැටි නොපෙනෙයි.

"මං මිනිස්සු එකතු කරනවා සුනන්ද.. " සුනන්ද ගෙන් පිළිතුරක් නොලැබෙන තැන රණසිංහ ම කතා කරයි. "..මට හැරෙන්න බැහැ.. මේ ගමන මං කොහොම හරි යන්න ඕනෙ.. තේරුණාද..? කොහොම හරි යන්න ඕනෙ.."

"මහත්තයගෙ ගමන මහත්තය යන්න.. ඒකෙ ප්‍රශ්නයක් නෑ.. ඒත් මේ තුට්ටු දෙකේ වැඩ වලට අහිංසක කොල්ලො බිලි දෙන එකට මං කැමති නෑ මහත්තයා.." රණසිංහ හිස ඔසවා සුනන්ද දෙස බලයි. සුනන්දගේ දෑස් කෝපයෙන් කුඩා වී ඇති සැටි ඔහුට මැනැවින් පෙනෙයි.

"මං මහත්තයා ළඟ හෙවණැල්ලක් වගේ හිටියා.. ආරක්ෂාව ඕනෙ වුණ තැනදි මගේ ජීවිතේ ගැන හිතන්නෙවත් නැතුව ආරක්ෂාව දුන්නා.. මහත්තය මට සල්ලි දුන්න තමයි.. ඒත් දැකල තියෙනවද මං කවදාවත් ඒ සල්ලි ගණන් කරනවා.. මට තිබුණෙ එකම අරමුණයි.. ඒ මහත්තයට උදව් කරන අරමුණ විතරයි.. ඒ වෙනුවෙන් මං කඩ කාමර ඉල්ලුවෙ නෑ.. බාර් ලයිසන් ඉල්ලුවෙ නෑ.. අර පුරෙන් මේ පුරෙන් ඉඩම් ඉල්ලුවෙ නෑ.. කළා නම් කළේ වත්තෙ කොල්ලෙකුට දෙන්නෙකුට රස්සාවල් හොයල දෙන්න කියල කළ ඉල්ලීම් විතරයි... මහත්තය කරල දෙන්නයි කියල මට කිව්ව හැම වැඩක්ම වගේ මං කරල දීල තියෙනව.. මං නොකළේ ආත්ම ගරුත්වයක් තියෙන මිනිහෙක් හැටියට මට හිත හදාගෙන කරන්න බැරි තුට්ටු දෙකේ වැඩ විතරයි.. මහත්තය දැන් අජිත්ව අරගෙන තියෙන්නෙ අන්න ඒ තුට්ටු දෙකේ වැඩ ටික කරවගන්න කියලා මං දන්නවා.."

රණසිංහ බීර බෝතලයෙන් නැවත වීදුරුව පුරවා ගත්තේ ය.

"දැං මං කියන්න ඕනෙ මොකද්ද..? අනේ නෑ සුනා.. මං කවදාවත් එහෙම වැඩක් කරන්නෙ නෑ කියලද..? උඹ හිතන්නෙ මං එහෙම කියයි කියලද..? මට එහෙම කියන්න ඕනෙ කමක් නෑ.. උඹ මා ගැන හුඟක් දේ දන්නවා.. වෙන කිසිම කෙනෙක් නොදන්න දේවල් උඹ දන්නවා.. සමහර විට උඹ මා ගෙන ඕනෙවටත් වඩා දෙවල් දන්නවා.. ඔව් සුනන්ද.. උඹ මට කරල දෙන්න බෑ කියන වැඩ කර ගන්න මට ක්‍රමයක් තියෙන්න ඕනෙ.. මේ ගේම් එකේ හැටි එහෙමයි.. දේශපාලනය කියන්නෙ ජරා වලක් සුනා.. මේකට වැටුණම කළ යුතු දේ නොකළ යුතු දේ කියලා වර්ග දෙක තුනක් නෑ... හැම දේම කරන්න වෙනවා.. හොඳින් බැරි නම් නරකින්.." රණසිංහ මේසය හරහා සුනන්ද වෙත ළං වෙයි. ".. අපි මල්ලි රෑට පන්සල් ගිණි තියනවා.. උදේට ඒ පන්සටලම ගිහින් මල් පූජා කරනවා.." රණසිංහ ගේ සිනහව මුහුදේ ඝෝෂාව පරදවා සුනන්දට ඇසෙයි. රණසිංහ මේසයෙන් නැගිටියි.

"යමු.. අපි දෙන්න දැන් පන්සල් යනවා.. නායක හාමුදුරුවො බැහැ දැකලා රෑයේ රෑ අසමජ්ජාති බල්ලො ටිකක් කළ පාහර වැඩේ ගැන උන්නාන්සෙට මගේ කණගාටුව ප්‍රකාශ කරන්න.. පළාතේ මන්ත්‍රී හැටියට ඒක මගේ යුතුකමක්නෙ.."

ළබන කළාපයට

**අපගේ පැතුම යහපත් ගුණගරුක දරුවන් සමාජයට බිහි කිරීමයි**

# බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසැල
**Brunswick Sinhala Language School**
**(Established in 1992)**

**Department of Education and Early Childhood Development (DEECD)**
**Community Language School Program 2009**
**Language Other Than English (Sinhala)**

**සිංහල භාෂාව**

භාෂාවට සමගාමීව අපටම හිමි ශ්‍රී ලාංකික උරුමය, සංස්කෘතිය, සභ්‍යත්වය හා දායාදයන් පිළිබඳ දැනීම මෙන්ම ආගමික (බුද්ධාගම, ක්‍රිස්තියානි ආගම) දැනුම වර්ධනය කිරීම අප පාසැලේ පරමාර්ථයන් වේ.

දරුවන්ගේ කායික, මානසික හා අධ්‍යාත්මික වර්ධනය උදෙසා පහත සඳහන් ජාතික, ආගමික හා අනෙකුත් විශේෂ උත්සවන් වාර්ශිකව පැවැත්වේ.

නිදහස් දින සැමරුම — සිංහල අවුරුදු උත්සවය. — වෙසක් පිරිත් දේශණය — පොසොන් සීල සමාදානය
ධර්ම දේශනය — ක්‍රීඩා හා ක්‍රියාකාරකම් දිනය. — කලා හා සංස්කෘතික විවිධ ප්‍රසංගය — නත්තල් උත්සවය.

Conducted by qualified and experienced teachers, in the essential language-development areas of reading, writing, listening, speaking, body language and visual cues in accordance with the **Victorian Essential Learning Standards (VELS).**

Grades from prep to 10
Held on Sundays 9.00am to 12.30 pm at the
Gladstone Park Secondary College premises, No. 14 Taylors Drive, Gladstone Park 3046

Term 1, 2009 commences on the 1st of February.
For enrollment of new students please contact Mr Jayanthi Wanniarachchi on 9354 0913, Mr. Ashoka Weeraratne on 9308 1391 or Dr. Erosha Premaratne on 9497 4943

*Brunswick Sri Lankan Community Group Inc.*
**P.O BOX 395 BRUNSWICK**
ABN: 48510159629



## මගේ නම රැකි
## ජගතා නුඹයි

පුතු පැටියෙකු වඩා ගෙන
කටු මැටි ගසා පිදුරු හෙවිලූ
අපේ මේ පොඩි පැල්පතට
කලකට පසු පැමිණි පොඩි පුතේ

හා හපුරා කියා
මුනුබුරු පැටියෙකු ලබා දී
මා නාකියකු - සීයකු
කලා නොවැ නුඹ

එදා අම්මාගේ තනේ
සිඟිති දෑතින් බදාගෙන
බස බස ගගා නුඹ
කිරි බීපු හැටි මට මතකයි තවම

මා ලඟින් යන එන විට
කිරි පිරි තනේ අත හැර
පෙරලි පෙරලී හැරී මා දෙස
බලා පෑ සිනාවේ අගේ !

මා වඩා ගන්නැයි
බකිටි ගසමින් ඉඟිකොට
අම්මා තරහා ගන්වා
කිරි පත අහිමි කර ගත් හැටි !

මගේ තුරුලේ නිදා ගෙන
ඇඟට 'සැන්' පැන් ඉස
මා සුවඳ ගන්වා පූ
'කොර හොල්ලා' නේද නුඹ

උසින් මහතින් බරින්
මා අබිබවා සිටියත්
උඹ තාමත් අපේ පොඩි පුතා
මගේ නම රැකි ජගතා

වි. ක. ධර්මබන්ධු